# 17

# ක්‍රෝධයෙහි ස්වභාවය විස්තර කරන කෝධ වග්ගය

*දිවුලපිටිය, බලගල්ලේ සරස්වති මහ පිරුවන්පති,*

**පණ්ඩිත, පූජ්‍ය පහළගම ධම්මික ස්ථවිර**

බුද්දක නිකායේ දෙවැනි ග්‍රන්ථය ධම්මපද පාළිය යි. මෙහි වග්ග විසිහයක් තුළ ගාථා හාරසිය විසිතුනකි. ධම්මපදයේ ගාථා උදෙසා කථා නිර්මාණය සිදු කරන ලද්දේ අට්ඨකථා සංස්කරණයේ දී ය. ගාථා සියල්ලට ම කථා දෙසිය අනූනවයක් විවිධ තේමාවන් මුල් කරගෙන රචනා කොට තිබේ. එයට ධම්මපදට්ඨකථාව නමින් ව්‍යවහාර කරනු ලබයි. සිරිකුඩ්ඩ නම් රජුගේ විහාරයේ වාසය කළ කුමාරකස්සප තෙරුන්ගේ ආරාධනයෙන් මෙය රචනා කොට ඇති බව මෙසේ දැක්වේ.

"විහාරෙ අධිරාජෙන
කාරිතම්හි කතඤ්ඤුතා
පාසාදෙ සිරිකුඩ්ඩස්ස
රඤ්ඤො විහරතා මයා

නාසං අට්ඨකථං එතං
කරොන්තෙන සුනිම්මලං
ද්වාසත්තති පමාණාය
භාණවාරෙහි පාලියා"

ධම්මපදට්ඨකථාවේ කර්තෘත්වය පිළිබඳ ඒකමතික නිගමනයක් උගතුන් අතර නො පවතින බව පෙනේ. එහෙත් විමලචරණ ලෝ මහතාගේ මතය වන්නේ එවක මහාවිහාරයේ වැඩ වාසය කළ චුල්ලබුද්ධඝෝස නම් තෙර කෙනෙකුගේ රචනාවක් බව ය. ඊ. ඩබ්ලිව්. අදිකාරම් මහතාගේ ස්වකීය 'පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය, 33 පිටුව, 1963' නමැති කෘතියේ දී කර්තෘත්වය බුද්ධඝෝෂ හිමියන් බව සඳහන් කරයි. ගෛගර් මෙය බුද්ධඝෝස හිමියන්ගේ කෘතියක් සේ නො පිළිගනී. කෙසේ වෙතත් කර්තෘවරයා පිළිබඳ යම් වාද විවාද පැවතුණ ද සාමාන්‍ය පිළිගැනීම බුද්ධඝෝස හිමියන් මෙම අට්ඨකථාව රචනා කළ බව යි.

පාලි ධම්මපදයේ ගාථා විෂයෙහි කළ අර්ථ වර්ණනාව ධම්මපදට්ඨකථාව නම් වෙයි. එයින් ගාථා විෂයෙහි විවිධ කථා වස්තු නිර්මාණය කොට සිත් ගන්නා ආකාරයෙන් යම් ආදර්ශ, ජීවිතාවබෝධය, සාරධර්ම, හරපද්ධතීන් හා ආචාර ධර්ම සිරිත් විරිත් උගැන්වීමට බොහෝ සෙයින් මෙම ග්‍රන්ථය උත්සාහ දරා ඇත.

මෙම ධම්මපදට්ඨකථාව තුළින් සද්ධර්මරත්නාවලිය වැනි අද්විතීය සිංහල සාහිත්‍ය ග්‍රන්ථ නිර්මාණකරණය සඳහා ද මාර්ගෝපදේශකත්වය සපයා තිබේ. ධර්ම භාණ්ඩාගාරයක් බඳු වූ ධම්මපදය උදෙසා කළ පදත්ථවණ්ණනාව ධම්මපදට්ඨකථා නමින් හඳුන්වයි.

ධම්මපද පාළියෙහි වග්ග විසි හය තුළ දාහත්වෙනි වග්ගය වශයෙන් කෝධ වග්ගය පෙළගැස්වා ඇත. මෙම වග්ගයෙහි ගාථා දාහතරකි. සියලු ගාථා ක්‍රෝධයෙහි ස්වභාවය පිළිබඳ විස්තර කිරීමට උත්සුක වී ඇත. කොධ යන්න සිතේ ඇති ස්වභාවයක් පෙන්වා දීමට යොදා තිබේ. එයින් සත්ත්වයා නිතැතින් ම දුගතියට විනිපාතයට පත් වෙයි. ඉන් මිදී ක්‍රියාත්මක වීමෙන් සුගතියට හා නිවනට පත්වන බව මෙම කෝධ වග්ගය තුළින් උපදෙස් සපයයි. ධම්මපද අට්ඨකථාවේ ගාථා පදත්ථවණ්ණනා දෙස බලන විට පළමු ගාථාව සඳහා පදත්ථවණ්ණනාව තුළ ක්‍රෝධය මෙසේ පැහැදිලි කරයි. ක්‍රෝධය නම් සියලු ආකාරයෙන් යුත් ක්‍රෝධය යි. කුධ, කොපෙ (කිපීමෙහි) ධාතුවෙන් නිපන් පදයකි. සිතේ ස්වභාවය වෙනස්වීම එකී වෙනස්වීම සිතේ උපශාන්ත භාවයට නොව විසිරුණු බවට පත්වීමකි. එමගින් තිදොරෙහි ක්‍රියාකාරිත්වය පුද්ගලයාට අහිතකර වෙයි. ඒ බව මණ්ඩූකෝපමාවෙන් පැහැදිලි කොට ඇත. ඊට අමතර ව ක්‍රෝධයෙහි ස්වභාවය පෙන්වා දෙන උපමා රැසක් පෙළ හා තත් අට්ඨකථා තුළ විරචිත ය.

## චර්ම රෝගියා සෝවාන් ඵලයට

බුදුන් දවස රෝහිණියට වැළඳුණු චර්ම රෝග පිළිබඳ අතීත හේතුව ක්‍රෝධ කිරීම යි. ඇය බරණැස් රජුගේ එක් නිළියකට වෛරී චේතනාවෙන් කසඹිලියා ගෑම නිසා චර්ම රෝගයෙන් පීඩිත ව ජීවත් වීමට සිදු විය. ස්වල්ප ලෙස හෝ ක්‍රෝධ කිරීම හා ඊර්ෂ්‍යා කිරීම නො සුදුසු බව ඇය පෙන්වා දුන්නා ය. බුදුරදුන්ගේ දේශනාව කෙළවර රෝහිණිය සෝවාන් ඵලයට පත් විය. ඇගේ රෝගී සිරුර රන්වන් පැහැයෙන් යුක්ත විය. ඇය ඉන් චුත ව දෙව් ලොව ඉපිද සක්දෙවිඳු සමීපයෙහි වාසය කරන්නට වූවා ය.

## නියම රියැදුරා

බුදුරදුන් ඉදිරියට අඬමින් පැමිණි දෙව් දුවක් වූවා ය. දෙව් දුව ඇඬීමට හේතු කාරණා විමසූ විට ප්‍රකාශ කොට සිටියේ එක්තරා භික්ෂුවක් විසින් තමා හා පුතු වාසය කරන ගස සිඳ දැමූ බව යි. මෙම භික්ෂුවගේ ක්‍රියාවෙන් කෝපයට පත් දෙව් දුව විසින් එම භික්ෂුවට ගසා මරණයට පත්කිරීමට දැත එස වූ නමුත් ඉන් සිදු වන අකටයුත්ත මෙනෙහි කොට බුදුරදුන් අභිමුවට පැමිණ දන්වා සිටියා ය. එවිට බුදුරදුන් "සාධු සාධු යහපත දෙව් දුව ඔබ විසින් යහපතක් ම කරන ලද්දේ ය. මෙසේ උස්සන ලද ඇවිස්සුණු කෝපය කම්පනයට පත් රථයක් මෙන් සන්සුන් වූ බව දේශනා කරමින් යම් සේ දක්ෂ රියැදුරා ඉතා වේගයෙන් ධාවනය වන රථය පාලනය කරගෙන තමා කැමැති ස්ථානයකට යයි ද එසේ ම පුද්ගල සිතේ උපන් කෝපය පාලනය කරන්නා දක්ෂ රියැදුරා වැනි යැ'යි දේශනා කළහ.

## දිනිය යුතු කරුණු හතරක්

උභයාර්ථය සාධනය කරගැනීම සඳහා පුද්ගලයා විසින් දිනිය යුතු කරුණු හතරක් කෝධ වග්ගයේ දී හමුවෙයි. අක්‍රෝධයෙන් ක්‍රෝධය දිනිය යුතු ය. උපන් ක්‍රෝධය මෛත්‍රිය බවට පත් කිරීම තුළින් ඉන් මිදිය හැකි ය. එවිට අන්‍යයන් සමග සහජීවනයෙන් වාසය කළ හැකි ය. අයහපත් තැනැත්තා යහපත් බැවින් දිනිය යුතු ය. ගතිගුණ හා චර්යාමය වශයෙන් යහපත් නම් ඔහු හෝ ඇය පහත් කිරීමෙන්, උපහාසයට ලක් කිරීමෙන්, ගරහ කිරීමෙන් නොව තමා සතු යහපත් ගතිගුණ හා චර්යාමය තත්ත්වයන් තුළින් ඔහු හෝ ඇය යහපත් කළ හැකි ය. තද මසුරු තැනැත්තා තමා සතු දේ දීමෙන් දිනිය යුතු ය. දැඩි ලෝභීත්වය ඇත්තෝ ද සමාජයේ ජීවත් වෙති. ඒ අය අන්‍යයන්ට කිසිදු දෙයක් දීමට අකැමැති ය. නො දී බැරි නිසා දෙනමුත් එයින් ඊට වඩා යමක් බලාපොරොත්තු වෙයි. එබන්දාට දීමෙන් හා දීම පුරුදු පුහුණු කිරීමෙන් ලෝභය දිනිය

හැකි ය. බොරු කියන්නා සත්‍ය වචන කීමෙන් දිනිය යුතු ය. ලොව සත්භාවයෙන් ජීවත් වන්නන් නොව අසත්භාවයෙන් ජීවත්වන්නෝ අධික ය. ඒ අය නිතර නිතර බොරු ප්‍රකාශනයෙහි උත්සුක ව ක්‍රියාත්මක වෙති. එහෙත් බොරුව සත්‍ය ප්‍රකාශනයෙන් ජයගත හැකි ය. ක්‍රෝධය වෙනුවට අක්‍රෝධයත් අයහපත් ගතිගුණවලට යහපත් ගතිගුණත් ලෝභ කමට දීමත් යන ගුණාංග හතර ප්‍රගුණ කිරීමෙන් දිනිය යුතු කරුණු වශයෙන් පෙන්වා දෙයි.

### දෙව්ලොව යාමට කරුණු තුනක්

මුගලන් තෙරුන් වහන්සේ දෙව්ලොව චාරිකාවේ යෙදී සිටිය දී හමු වූ දේවතාවියන්ගෙන් තමන් මෙසේ දිව්‍ය සම්පත් ලැබීමට හේතු වූ පුණ්‍ය ක්‍රියා ආදිය පිළිබඳ විමසූහ. එවිට එකී දේවතාවියක් කියන්නී, "ස්වාමීනි මම දානාදිය නො කෙළෙමි. කාශ්‍යප බුදුන් දවස දාසියක වීමි. මගේ සැමියා සැඩ පරුෂ ය. අතට හසු වූ දරකඩෙන් හෝ ලීයෙන් හෝ ගසා මගේ හිස පළයි. එවිට සිතට කෝපය ඇති වූ විට අත පා සිඳීමක් හෝ නාසාදිය කැපීමක් නොකෙළේ යැයි සිතා කෝප නො කෙළෙමි. ඒ පින් දිව්‍ය සම්පත් ලැබීමට හේතු වූ බව" ප්‍රකාශ කළා ය. ඊළඟ දේවතාවියගෙන් ද තොරතුරු විමසූ විට "මම ගිය ආත්මයක උක්හේනක් රැකිමෙහි යෙදී සිටිය දී භික්ෂුවකට උක්ලීයක් දුන්නෙමි." මෙසේ බලන විට සත්‍ය කීම, ක්‍රෝධ නො කිරීම හා දන් දීම යන කාරණා තුන හේතුවෙන් දෙව් ලොව ඉපිද දිව්‍ය සම්පත්තීන් අත් විඳින බව ඒ ඒ දේවතාවියන්ගේ ප්‍රකාශ තුළින් පැහැදිලි වෙයි.

### නින්දිත හෝ අනින්දිත පුද්ගලයෙක් නැත

සැවැත් නුවර වාසය කරන එක්තරා උපාසකයෙක් තම උපාසක පිරිස වූ පන්සියයක් දෙනා සමග රේවත තෙරුන්ගෙන් බණ ඇසීමට ගියේ ය. එවිට තමා ආමන්ත්‍රණය නො කළ නිසා ඊට කිපී බණ නො අසා සැරියුත් තෙරුන් වෙත බණ ඇසීමට ගොස් බණ ඇසීමට වාඩි විය. සැරියුත් තෙරුන් වහන්සේ පැමිණි කාරණා විමසා බලා අභිධර්මයෙන් බොහෝ වේලාවක් බණ දෙසූහ. අභිධර්මය තේරුම් ගැනීම නො හැකි බව කියා ඊට කිපී උපාසකයත් තම පිරිසත් ආනන්ද තෙරුන් වෙත ගියහ. උන්වහන්සේ අභිමුවෙහි ඉහත සිදුවූ පුවත් ප්‍රකාශ කොට බණ දෙසීමට ආරාධනා කෙළේ ය. ආනන්ද තෙරුන් වහන්සේ ඉතා කෙටියෙන් බණ දේශනා කළහ. කෙටියෙන් බණ දේශනා කළ හෙයින් ඊට කිපී බුදුන් හමුවට ගොස් තතු ප්‍රකාශ කිරීමෙන් අනතුරු ව 'නිහඬව සිටින්නා ද බොහෝ කථා කරන්නා ද මඳ පමණ කථා කරන්නා ද **ගර්හාවට පත් වෙති.** ඒකාන්තයෙන් ගැරහිය යුත්තන් ද ඒකාන්තයෙන් ප්‍රශංසා කළ යුත්තන් ද නැත. රජවරුන්ට ඇතැම් අය ගරහති. ඇතැම් අය ප්‍රශංසා කරති. මහපොළොව ද හිරු සඳු දෙදෙනා ද එසේ ගැරහුම් පැසසුම් ලබති. සිවු පිරිස මැද ධර්ම දේශනා කරන බුදුන්ට ද ඇතැම් අය පසසති. අඥාන බාල අයගේ නින්දා හෝ ප්‍රශංසා සැලැකිය යුතු නො වේ.' යනුවෙන් නින්දාවෙහි ප්‍රශංසාවෙහි ස්වභාවය දක්වයි. ප්‍රඥාවත් නැණවතුන්ගේ ප්‍රශංසාව ප්‍රශංසාව ම ය. නින්දාව නින්දාව ම ය. **(පණ්ඩිතෙන පන මෙධාවිනා නින්දිතො නින්දිතො නාම, පසංසිතො ච පසංසිතො නාම)** යනුවෙන් ප්‍රශංසාව හෙවත් අනින්දිත බවත් ගැරහුම හෙවත් නින්දාවත් ලොව සියලු දෙනාට ම පොදු බව පෙන්වා දෙයි.

**ක්‍රෝධාදිය සිතේ ඇති වෙයි. එහි ක්‍රියාත්මක බව වාචසික හා කායික කර්ම බවට පත් වෙයි. එබඳු කර්මවල විපාක ධම්මපදට්ඨකථාවේ කෝධ වග්ග වණ්ණනාවේ දී දැක්වෙයි. සිත ක්‍රෝධයෙන් ග්‍රහණය වූ විට එහි ආදීනව දක දැන ඉන් මිදීමට පුළුවන් නම් දෙලොව ජයගත හැකි ය. ලෞකික වශයෙන් ප්‍රියශීලී ප්‍රසාද ජනක පුද්ගලයකු විය හැකි ය. ආධ්‍යාත්මික වශයෙන් සකලෝපක්ලේශ විරහිත නිවනට පත් විය හැකි ය.**